# සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

## ප්‍රාසංගික කලාවේදී (ගෞරව) උපාධි අවසාන වසර පරීක්ෂණය - 2019/2020

## නර්තන හා නාට්‍ය කලා පීඨය

## <u>නර්තන රචනය හා කථක් නර්තන සිද්ධාන්ත – DIAK 41023</u>

## <u>භරත නාට්‍යම් සිද්ධාන්ත – DIAB 41023</u>

කාලය :- පැ 03

- සැ.යු :- පිළිතුරු ලිවීම ආරම්භ කිරීමට පෙර දී ඇති උපදෙස් හොඳින් කියවන්න.

---

- මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හතකින් (07) සමන්විත ය.
- ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයක් සඳහාම පිළිතුරු අලුත් පිටුවකින් ආරම්භ කරන්න.
- සියලුම ප්‍රශ්න සඳහා සමාන ලකුණු ලැබේ. (එක් ප්‍රශ්නයට ලකුණු 15 බැගින් මුළු ලකුණු 60 කි)

---

1. "භාරතීය නර්තනය සතර අභිනයෙන් පෝෂණය වූවකි." එක් නර්තන සම්ප්‍රදායක් ඇසුරින් විමසුමක යෙදෙන්න.

2. "19 වන සියවස භරත නාට්‍යම් සම්ප්‍රදායේ අභිවර්ධනීය කාල පරිච්ඡේදයකි." එහි අභිවර්ධනයට දායක වූ ශිල්පීන් ඇසුරින් විමසුමක යෙදෙන්න.

3. "අභිනය දර්පණයේ නිරූපිත හස්ත මුද්‍ර ඉන්දීය නර්තනයේ සංවිධිත බව කෙරෙහි බෙහෙවින් ඉවහල් වී ඇත. නිදර්ශණාත්මකව සාකච්ඡා කරන්න.

4. චෝල හා පල්ලව රාජධානි සමයේ දේශපාලන, සමාජ හා සංස්කෘතික පසුබිම භරත නාට්‍යම් සම්ප්‍රදායේ ප්‍රගමනය උදෙසා කොතෙක් දුරට ඉවහල් වී ඇත්දැයි එම යුගයට අයත් සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ඇසුරින් විමසුමක යෙදෙන්න.

5. සතර අභිනයෙහි භාවිතය පිළිබඳ භාරතීය හා දේශීය එක් නර්තන සම්ප්‍රදායක් ඇසුරින් තුලනාත්මකව සාකච්ඡා කරන්න.

6. නර්තන රචනය යන්න අර්ථ දක්වා එහි භාවිත මූලධර්ම පිළිබඳ විමසුමක යෙදෙන්න.

7. ගෝපාල ක්‍රිෂ්ණ භාරති, මුතු තාණ්ඩවාර්, ක්ෂේත්‍රඥ ස්වාතිතිරුනාල්, ජයදේව හා සාරංගදේව යන සංගීතඥයින් නර්තනයේ ප්‍රගමනය උදෙසා සිදුකරන ලද දායකත්වය සාකච්ඡා කරන්න.

…………………. 2023.01.20